# ජාතික විජාතික බල අරගලය

එ ජා පක්ෂය හා ශ්‍රී ල නි පක්ෂය අතර ඇත්තේ එක් අවබෝධතා ගිවිසුමක් පමණකි. ඒ ගිවිසුමෙන් කියැවෙන්නේ පක්ෂ දෙක අතර කිසිම විශ්වාසයක් නැති බව ය. එකිනෙකා පරයා බලය ලබාගැනීම සඳහා කටයුතුකරන පක්ෂ දෙකක් පමණක් ලෙස අපට ඒ පක්ෂ හඳුනාගතහැකි ය. ඒ පක්ෂ දෙක අතර වෙනස්කම් ද වෙයි. එ ජා පක්ෂය විජාතික බලවේගවල පක්ෂය වෙයි. එහි කලක් යම් ජාතිකත්වයක් නොතිබුණා නො වෙයි. ශ්‍රී ල නි පක්ෂය ආරම්භකිරීමට පෙර මෙරට ජාතිකත්වය අගය කළ බොහෝ අය එ ජා පක්ෂයට තම ඡන්දය දුන්හ. ජාතිකත්වය අගය කළ යම් පිරිසක් සමසමාජ පක්ෂයට හා පසුව කොමියුනිස්ට් පක්ෂයට ඡන්දය නොදුන්නා නො වේ. ඔවුන් එසේ ඡන්දය දුන්නේ ඒ පක්ෂවල අධිරාජ්‍ය විරෝධී ස්වභාවය හේතුකොටගෙන ය. එහෙත් ඒ පක්ෂ දෙකෙහි එදා හෝ අද හෝ ජාතිකත්වයක් නැත. පසුව බිහි වූ ට්‍රොට්ස්කිවාදී ත්‍රිරෝද පක්ෂ ගැන ද කිවහැක්කේ එපමණ ය. මාක්ස්වාදී පක්ෂවල අධිරාජ්‍ය විරෝධය සමග ජාතිකත්ව විරෝධයක් ද වෙයි. ශ්‍රී ල නි ප පනස්හතරෙන් පමණ පසුව මෙරට ජාතිකත්වයේ පක්ෂය බවට පත්වී ඇත.

බටහිරයන්ට මෙරට දේශපාලනය කිසිදිනක තේරුම්ගත නො හැකි ය. එයට හේතුව විශේෂයෙන් ම සිංහල ජනයාගේ න්‍යාය (ලොජික්) බටහිර ඇරිස්ටෝටලීය න්‍යායෙන් වෙනස්වීම ය. සිංහල මිනිසුන්ගේ න්‍යාය ශ්‍රී ල නි පක්ෂයට ද උරුම වී ඇත. එ ජා පක්ෂය හා මාක්ස්වාදී පක්ෂ බටහිර ප්‍රවාදවලට අනුව උඩින් මෙහෙයවනු ලබන අතර, ශ්‍රී ල නි පක්ෂය බොහෝ විට ජනතාව විසින් මෙහෙයවනු ලැබෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඒ වෙනස්කිරීමට උත්සාහ කළා ය. හරය ලෙස ගත්කල එහි දී සිදුවූයේ මෙරට විජාතික බලවේග ඇය ලවා ශ්‍රී ල නි පක්ෂය වෙනස්කරවීමට උත්සාහ දැරීම ය. එහෙත් විජාතික බලවේගවලට බණ්ඩාරනායකවරුන්ගේ දියණියක ලවාවත් ඒ කරවාගත නො හැකි විය. අවසානයේ දී බණ්ඩාරනායකවරුන්ට ශ්‍රී ල නි පක්ෂය ද නැතිවිය.

මෙරට හා බටහිර විජාතික බලවේගවලට අවශ්‍ය වූයේ හැකිනම් එ ජා පක්ෂය හා ශ්‍රී ල නි පක්ෂය එක්කර ඒ දෙකම ලවා සිංහලත්වය නැතිකරවීම ය. බටහිරයන් විසින් ම ඇතිකරනු ලැබූ ද, මිථ්‍යාවන් මත පදනම් වූ ද, දෙමළ ජාතිවාදයේ ඊනියා අභිලාෂය මුදුන්පත් කරවමින් සහසන්ධීය රාජ්‍යයක් ඇතිකිරීම බටහිරයන්ගේ අභිප්‍රාය විය. ඒ සඳහා මුල දී අපකීර්තිමත් ලියම් ෆොක්ස් ගිවිසුම අත්සන් කෙරිණි. පසුගිය දා රනිල් වික්‍රමසිංහ හා මහින්ද රාජපක්ෂ මහත්වරුන් ගේ සහභාගීත්වයෙන් එ ජා පක්ෂය හා ශ්‍රී ල නි පක්ෂය අතර ඇතිකෙරුණු ඊනියා අවබෝධතා ගිවිසුම ලියම් ෆොක්ස් ගිවිසුමෙහි ම දිගුවක් පමණක් විය. එහෙත් ඒ පක්ෂ දෙක අතර අමාරුවෙන් ඇතිකරනු ලැබෙන එවැනි ගිවිසුම්වලට එතරම් ආයුෂක් නැත. බටහිරයන්ට සිංහලයන්ගේ න්‍යාය නොතේරීම කෙතරම් භාග්‍යයක් ද?

ශ්‍රී ල නි පක්ෂය ප්‍රමුඛ පොදුජන එක්සත් පෙරමුණ හා ජ වි පෙ අතර සන්ධානයක් ඇතිකරනු ලැබුයේ ජාතිකත්ව බලවේග ඉදිරියට ගෙනයෑමට ය. ඒ සන්ධානය පිහිටුවීමෙහි ලා ජාතිකත්වයට එරෙහිව සුදු නෙළුම් ගෙන තවලම් ගියවුන් නායකත්වය දැරීම විසංවාදයක් ලෙස සැලකියහැක්කේ ඇරිස්ටෝටලීය න්‍යායෙහි ය. සිංහලයන්ගේ න්‍යායෙහි එය විසංවාදයක් නො වේ. ඒ සංධානයෙහි ප්‍රතිඵලයක් ලෙස පරිවාස ආණ්ඩුවක් බිහිවිය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වයෙන් බිහි වූ පරිවාස ආණ්ඩුවෙහි ජ වි පෙරමුණෙහි නායකයෝ ද ඇමතිකම් දැරූහ. සංධාන සංකල්පය තවදුරටත් පෙරට ගෙනයෑමේ ප්‍රතිඵලය වූයේ බලයේ සිටීමට වෙනත් විකල්පයක් නැතිකම නිසා සංධානයට ආශිර්වාදය ලබාදුන් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය සංධානයෙන් විසිවීමත් මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති ධුරයට පත්වීමත් ය. ජනාධිපතිවරණයේ දී මහින්ද චින්තන සූත්‍රගතකිරීම සඳහා ජ වි පෙරමුණේ ද ජාතික හෙළ උරුමයේ ද සහාය ලැබිණි.

එහෙත් මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවීමෙන් පසුව පිහිටුවනු ලැබූ ආණ්ඩුවෙහි ජ වි පෙරමුණ ඇමතිධුර භාරනොගැනීමට තීරණය කෙළේ ය. ජ වි පෙරමුණෙහි දේශපාලන බලමණ්ඩලය ඇමතිධුර භාරගෙන ආණ්ඩුවට එක්වීමට තීරණය කර තිබිය දී පක්ෂයෙහි මධ්‍යම කාරක සභාව එයට පටහැණිව ආණ්ඩුවට එක්නොවීමට ඉටාගෙන ඇත. ඒ අනුව ජ වි පෙරමුණ තාවකාලිකව ආණ්ඩුවෙහි ඇති එමෙන් ම නැති පක්ෂයක් බවට පත්විය. එහි ප්‍රතිඵලය වූයේ ජාතිකත්ව බලවේග දුර්වල වීම ය ; මහින්ද රාජපක්ෂ මහතා බලය රැකගැනීම සඳහා විජාතික බලවේගවල

© Prof. Nalin De Silva

නියෝජිතයන් සමග ද යම් යම් එකඟතා ඇතිකර ගැනීම ය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වයෙන් වූ ආණ්ඩුවක ඇමතිකම් දැරූ ජ වි පෙරමුණට ඇයට වඩා ජාතිකත්වයක් ඇති මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවේ ඇමතිධුර භාරගැනීමට නො හැකිවී ය. යම් අයුරකින් ජ වි පෙරමුණ ද ආණ්ඩුවෙහි සාමාජිකයකුව සිටියේ නම් ජාතිකත්ව බලවේග ශක්තිමත් වී නෝර්වේ නියෝජිතයන් හා ඊනියා සටන් විරාම නිරීක්ෂකයන් ගෙදර යැවීමේ හැකියාව තිබුණි. එහෙත් ඒ එසේ නො වී ය.

මහින්ද චින්තන ඒකීයත්වය වටා ගෙතී ඇත. මහින්ද චින්තනවල මුඛ්‍ය තේමාව ආර්ථිකය හෝ වෙනත් කිසිවක් නොව රටෙහි ඒකීයත්වය ආරක්ෂාකිරීම ය. මේ ඒකීයත්වය මෙරට ඇතැම් ඇංකර දේශපාලන විද්‍යාඥයන් කියන්නාක් මෙන් බ්‍රිතාන්‍යයන් අපට දුන් එකක් නොව මෙරට තිබූ එක්සේසත් රාජ්‍යයෙහි ම එක් අංගයක් වෙයි. අද මෙරට සිංහල ජනතාව ආර්ථික අමාරුකම් සියල්ල ඉවසාගෙන සිටින්නේ ඒකීයත්වය රැකගැනීමේ හා දෙමළ ජාතිවාදය පරාජය කිරීමේ අවශ්‍යතාව වෙනුවෙනි. ඒ එසේ වුවත් බලය රැකගැනීම සඳහා විවිධ ෆෙඩරල්වාදීන් සමග එකඟතා ඇතිකරගැනීමට මහින්ද රාජපක්ෂ මහතාට සිදුවිය. ජ වි පෙ ආණ්ඩුවෙහි කොටස්කරුවකු වී නම් ඒ සිදුවීමට ඉඩක් නො තිබුණි. මහින්ද රාජපක්ෂ මහතාට එසේ ෆෙඩරල්වාදීන් සමග එකඟතා ඇතිකරගැනීමට සිදුවුණා පමණක් නොව පොදුජන එක්සත් පෙරමුණෙහි සමසමාජ කොමියුනිස්ට් පාක්ෂිකයෝ ද වෙනත් අය ද එම ෆෙඩරල් මතවාද ඉදිරියට ගෙනඑමින් ආණ්ඩුවට බලපෑම් දැමීමට පටන්ගත්හ. මේ සියළුම වමට, එනම් සමසමාජ කොමියුනිස්ට් ත්‍රිරෝද ට්‍රොට්ස්කිවාදී, පශ්චාත් මාක්ස්වාදී ආදී එකී මෙකී නොකී වමට, මෙරට අද ඡන්ද දහදාහවත් නැත. එහෙත් කසිකබල් මාධ්‍ය ඔස්සේ ඔවුනට ඡන්ද ලක්ෂ ගණනාවක ප්‍රචාරයක් හිමිවෙයි. මාධ්‍ය යනු මෙරට දේශපාලනය (හෝ සාහිත්‍ය හෝ කලාව හෝ) නොවන බව හිස උදුම්මාගෙන පත්තර එක්ටැම් ගෙවල්වල ජීවත්වන ඇතැම් ඊනියා මාධ්‍යවේදීන්ට කිසි දිනක අවබෝධ නොවනු ඇත. ඒ කෙසේ වෙතත් ෆෙඩරල්වාදීහු මාධ්‍යවල ද ආධාරය ඇතිව තමන්ට නැති බලයක් ආරෝපනය කරගනිති. එය පුස්සක් බව විජාතික බලවේග නො දනියි.

ෆෙඩරල්වාදීන් එසේ මාධ්‍ය ඔස්සේ ඉදිරියට පැමිණෙන විට එ ජා පක්ෂයේ අභ්‍යන්තර අවුලක් හේකොටගෙන එහි ඇතැම්හු ආණ්ඩුවට එක්වීමේ උත්සාහයක නිරතවූහ. මේ පිරිස අතර ෆෙඩරල්වාදීහු ද වූහ. එහෙත් විජාතික බලවේගවලට ඒ ෆෙඩරල්වාදීන් ගැන වුව ද එතරම් විශ්වාසයක් නො තිබුණි. ඔවුහු එහි ප්‍රතිඵලයක් ලෙස එ ජා පක්ෂය හා ශ්‍රී ල නි පක්ෂ අතර ඊනියා අවබෝධතා ගිවිසුමක් ඇතිකර ජාතිකත්වය හා ඒකීයත්වය නැතිකිරීමට කටයුතු කළහ. අද දේශපාලනයෙහි සිදුවන්නේ මේ ගිවිසුම ආරක්ෂාකිරීම හෝ කැඩීම හෝ පිලිබඳ කඹඇදිල්ල ය. අද ආණ්ඩුවට එකතුවන්නේ ය, හෙට එකතුවන්නේ ය ආදී වශයෙන් කියන පිරිස් මේ ලියන මොහොත වන තුරුත් ආණ්ඩුවට එකතු වී නැත. විජාතික බලවේග තවමත් තම බලාපොරොත්තු අත්හැරගෙන නැත. ඔවුන් එසේ අත්හරීවි යැයි සිතිය නො හැකි ය.  යම් අයුරකින් ඊනියා අවබෝධතා ගිවිසුම ඉරාදමා අර පිරිස ආණ්ඩුවට එකතු වුව ද, විජාතික බලවේග ඔවුන්ට කළහැකි උපරිම කාර්ය කුමක් දැයි සොයා බලනු ඇත. ඉතා පැහැදිලිව ම ඔවුන් ඒ කණ්ඩායම තම අවශ්‍යතාව වෙනුවෙන් යොදාගනු ඇත. විශේෂයෙන් ම ඒ කණ්ඩායමේ ෆෙඩරල්වාදීන් ඒ සඳහා යොදා ගැනෙනු ඇත්තේ ඒ පිරිස ගැන ඔවුන්ගේ එතරම් විශ්වාසයක් නො තිබිය දී ය.

ජාතික බලවේගවලට අද විජාතික බලවේග පැරදවීම හැර වෙනත් විකල්පයක් නැත. අද ආණ්ඩුවේ බොහෝ ෆෙඩරල්වාදීහු වෙති. මහින්ද චින්තන බොරුවට පිළිගෙන අවස්ථාව එළඹෙන තෙක් හොරගල් (ෆෙඩරල්ගල්) ඇහිලූ සමසමාජ කොමියුනිස්ට් පත්කළ මනත්‍රීහු (ඔවුන්ට කිසි දිනක ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පැමිණිය නො හැකි ය) මෙන් ම දෙමළ හා මුස්ලිම් ජාතිවාදී මන්ත්‍රීවරු ද එහි වෙති. එහෙත් මේ කිසිවකුටවත් ජනතාව දී ඇති තීන්දුව වෙනස්කිරීමට නොහැකි වන තැනට කටයුතුකිරීම ජාතිකත්වවාදීන්ගේ කාර්යභාරය වෙයි. මෙරට උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීමටවත් ෆෙඩරල් හෙවත් සන්ධීය රාජ්‍යයක් ඇතිකිරීමටවත් කිසිදු ඓතිහාසික, භූගෝලීය, සංස්කෘතික හෝ වෙනත් සාධකයක් නැත. දෙමළ ජාතිවාදීන්ගේ අභිලාෂය යන්න කිසිසේත්ම ඒ සඳහා පිළිගතහැකි සාධකයක් නො වේ. ජාතිකත්වවාදීන්ට තවමත් විජාතික බලවේග පරාජයකිරීමට හැක්කේ ආණ්ඩුවෙහිම සිටිමිනි. ජාතිකත්වය සඳහා යැයි කියමින් ආණ්ඩුවෙන් ඈත්වීම හා ආර්ථික කරුණු උපයෝගීකරගැනීම විජාතික බලවේග ශක්තිමත්කිරීම සඳහා ම අවසානයේ දී යොදාගැනෙනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva